# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2014 සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්


පිටුව

1. 2014 අංක 15 දරන මුදල් නීති (සංශෝධන) පනත 1

2. 2014 අංක 39 දරන ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත 1

## 2014 අංක 15 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 24 වන දින]

**(422 වන අධිකාරය වූ) මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2014 අංක 15 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 6 වන වගන්තිය, ඒ වගන්තියේ "ඒ මුදල, ව්‍යවහාර මුදල් කොමසාරිස්වරුන්ගේ මණ්ඩලයේ වත්කම් අතිරික්තයෙන් බැංකුව වෙත මෙයින් හිමිකර දෙනු ලැබේ." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

   "ඒ මුදල, ව්‍යවහාර මුදල් කොමසාරිස්වරුන්ගේ මණ්ඩලයේ වත්කම් අතිරික්තයෙන් බැංකුව වෙත මෙයින් හිමිකර දෙනු ලැබේ:

   එසේ වුව ද, මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවෙහි මූල්‍ය පද්ධතියෙහි ශක්‍යතාවය සහ ස්ථාවරභාවය සැලකිල්ලට ගෙන, ජාතික ආර්ථිකයෙහි යහපත උදෙසා, කලින් කල, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මහ බැංකුවේ ප්‍රාග්ධනය රුපියල් බිලියන පනහක් නොඉක්මවන මුදල් ප්‍රමාණයකට වැඩි කරනු ලැබිය හැකි ය.".
3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2014 අංක 39 දරන ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2014 නොවැම්බර් මස 01 වැනි දින]

**ඩීඑෆ්සීසී බැංකුව "ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී" නාමයෙන් සීමාසහිත පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, එකී ලියාපදිංචි කිරීමට ආනුෂංගික වන විධිවිධාන සැලැස්වීම සඳහා ද; (165 වන අධිකාරය වූ) ඩීඑෆ්සීසී බැංකුව පනත පරිච්ඡින්න කිරීම සඳහා ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2014 අංක 39 දරන ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. (165 වන අධිකාරය වූ) ඩීඑෆ්සීසී බැංකුව පනත අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි (මෙහි මින්මතු "නිශ්චිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට පරිච්ඡින්න කරනු ලැබිය යුතු ය. එම දිනය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට මාස හයකට වඩා පසු නොවන දිනයක් විය යුතු ය.
3. (1) අමාත්‍යවරයා විසින්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් පසු කවර හෝ අවස්ථාවක, නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි ඩීඑෆ්සීසී බැංකුව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ "ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී" නමින් සීමාසහිත පොදු සමාගමක් වශයෙන් ලියාපදිංචි කරන ලෙස නියම කරනු ලබන විධානයක් ද සමග, මුදල් මණ්ඩලය විසින් යථා පරිදි අනුමත කරනු ලැබූ සාංගමික ව්‍යවස්ථාවලිය සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

   (2) 2007 අංක 07 දරන සමාගම් පනතේ කුමක් සඳහන්ව තිබුණ ද, (1) වන උපවගන්තිය යටතේ විධානයක් ලැබුණු විට, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින්—

   (අ) ඉහත කී පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සංස්ථාගත කිරීමේ සහතිකයක් "ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී" නමින් නිකුත් කළ යුතු ය; සහ

   (ආ) ඩීඑෆ්සීසී බැංකුවේ ව්‍යාපාර කටයුතු භාරගෙන ක්‍රියාකාරී ව කරගෙන යාම සඳහා (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) "ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී" නාමයෙන් සීමාසහිත පොදු සමාගමක්, නිශ්චිත දිනයේ සිට සංස්ථාගත කරන ලද බව ප්‍රකාශ කරන නියමයක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.
4. ඩීඑෆ්සීසී බැංකුවේ ව්‍යාපාරය, නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි, සමාගම වෙත පරම වශයෙන් සතු වන්නේ ය.
5. වෙනත් යම් නීතියක යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද, නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි—

   (අ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුවේ කොටස් ප්‍රාග්ධනය සහ කොටස් අධි මිල ගිණුමේ බැරට පවතින යම් මුදලක් නිශ්චිත දිනයේ දී සමාගමේ ප්‍රකාශ කළ කොටස් ප්‍රාග්ධනය ලෙස සලකනු ලැබිය යුතු ය;

   (ආ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුවේ සිටි සියලු කොටස් හිමියන් නිශ්චිත දිනයේ දී සමාගමේ සිටි කොටස් හිමියන් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම කොටස් හිමියන් විසින් සමාගමෙහි දරනු ලබන කොටස් සංඛ්‍යාව නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔවුන් විසින් ඩීඑෆ්සීසී බැංකුවෙහි දරන ලද කොටස් සංඛ්‍යාවට සමාන විය යුතු ය. ඩීඑෆ්සීසී බැංකුව විසින් නිකුත් කරන ලද සියලු කොටස් සහතික, සමාගම විසින් නිකුත් කරන ලද්දා වූ කොටස් සහතික ලෙස කියවා තේරුම් ගත යුතු ය;

   (ඇ) ඩීඑෆ්සීසී බැංකුව විසින් නිකුත් කරනු ලැබුවා වූ ද, නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ශේෂව පවතින්නා වූ ද ඕනෑම වර්ගයක සියලු සුරැකුම්පත් නිශ්චිත දිනයේ සිට සමාගම විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් ලෙස සලකනු ලැබිය යුතු ය;

   (ඈ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුවේ ධුර දරමින් සිටි සභාපතිවරයා, අධ්‍යක්ෂවරුන්, නිලධරයන්, සේවා නියුක්තයන් සහ සේවකයන්, නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි සමාගමේ සභාපතිවරයා, අධ්‍යක්ෂවරුන්, නිලධරයන්, සේවා

නියුක්තයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම සභාපතිවරයා, අධ්‍යක්ෂවරුන්, නිලධරයන්, සේවා නියුක්තයන් සහ සේවකයන් නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුව යටතේ භුක්ති විඳින ලද නියම හා කොන්දේසි මත තවදුරටත් සමාගමෙහි ධුර දැරිය යුතු ය;

(ඉ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ සහ බලාත්මක වූ ද, ඩීඑෆ්සීසී බැංකුව පාර්ශ්වකරුවකු වූ හෝ ඩීඑෆ්සීසී බැංකුවේ වාසියට වූ ද, ඩීඑෆ්සීසී බැංකුවේ සියලු කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇපකර, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජිතත්ව ප්‍රදාන සහ කවර හෝ ස්වභාවයක වූ වෙනත් සාධන පත්‍ර නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි සමාගම ඇතුළත් වූ නැතහොත් සමාගමේ වාසියට දෙන ලද කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇපකර, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජිතත්ව ප්‍රදාන සහ වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ හෝ බලාත්මක වූ ද, මුදල් මණ්ඩලය, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා, විනිමය පාලක, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, නාගරික සංවර්ධන අධිකාරිය, වෙනත් යම් නියාමන ආයතනයක් හෝ අධිකාරියක්, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත ප්‍රදානය කරනු ලැබුවා වූ ද සියලු අනුමතයන් හෝ බලපත්‍ර නිශ්චිතව ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇත්නම් හෝ වෙනත් යම් නීතියක් මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ආදේශ කරනු ලැබ ඇත්නම් මිස, නිශ්චිත දින සිට බලපවත්වන පරිදි සමාගම වෙත ප්‍රදානය කරන ලද අනුමතයන් හෝ බලපත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(උ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුව සහ ශ්‍රී ලංකා ආණ්ඩුව, එහි දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වෙනත් යම් තැනැත්තකු අතර පවත්වා ගෙන යනු ලැබුවා වූ යම් ගිණුමක්, එකී ගිණුම ඒ බැංකුවේ වත්කමක් නැතහොත් බැරකමක් හෝ වී ද ඒ ගිණුම ඩීඑෆ්සීසී බැංකුව හා ඒ වෙනත් තැනැත්තා අතර දිගටම පවත්වා ගෙන යනු ලැබී නම් ඊට අදාළ විය හැකිව තිබුණු (හිලව් කිරීමේ අයිතිය ද ඇතුළු) අයිතිවාසිකම්වලින් යුක්ත වූ සහ ඊට අදාළ විය හැකිව තිබුණු බැඳීම් සහ සිද්ධීන්වලට යටත්, ඒ සමාගම සහ ඒ වෙනත් තැනැත්තා අතර පවතින ගිණුමක් ලෙස නිශ්චිත දින සිට බලපවත්වන පරිදි සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ වෙනත් තැනැත්තා විසින් ඒ ගිණුමට අදාළව දෙන ලදුව නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ, යම් උපදෙසක්, නියෝගයක්, විධානයක්, බලය දීමක් හෝ අවසරයක්, ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇත්නම් හෝ අවලංගු කර ඇත්නම් මිස, නැතහොත් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු හෝ අවලංගු කරනු ලබන තෙක්, සමාගම සහ ඒ වෙනත් තැනැත්තා අතර පවතින ගිණුම සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර, ඒ ගිණුම සම්බන්ධයෙන් බලාත්මක විය යුතු ය;

(ඌ) යම් තැනැත්තකුගේ (වර්තමාන හෝ අනාගත, තථ්‍ය හෝ අසම්භාව්‍ය) ණය හෝ බැරකම් ආපසු ගෙවීමේ සුරැකුමක් වශයෙන් නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුව විසින් දරනු ලැබූ යම් උකසක්, සුරැකුමක් හෝ හානිපූරණයක් නිශ්චිත දින සිට බලපවත්වන පරිදි සමාගම වෙත ගෙවීමට ඇති ඒ ණය හෝ බැරකම් ආපසු ගෙවීම සඳහා වූ සුරැකුමක් ලෙස සමාගම විසින් දරනු ලබන හා සමාගම සතුව පවතින උකසක්, සුරැකුමක් හෝ හානිපූරණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම උකස, සුරැකුම හෝ හානිපූරණය මගින් සුරක්ෂිත කරනු ලැබූ මුදල් තුළ ඒ තැනැත්තාගේ අනාගත අත්තිකාරම් හෝ බැරකම් ඇතුළත් වන අවස්ථාවක දී එම තැනැත්තාගේ අනාගත අත්තිකාරම් හෝ සමාගම වෙත ආපසු ගෙවීමට ඇති බැරකම් වෙනුවෙන් තබා ඇති සුරැකුම්, නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුව වෙත සුරක්ෂිත කරන ලද අනාගත අත්තිකාරම් හෝ බැරකම් ප්‍රමාණය දක්වා සුරක්ෂිත කරන ලද සුරැකුම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(එ) වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් භාරකරුවකු වශයෙන් නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුවේ භාරයේ පැවති යම් ලේඛනයක්, භාණ්ඩ හෝ දරනු ලැබූ වෙනත් යම් දේපළ, නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි ඒ වෙනත් තැනැත්තා වෙනුවෙන් භාරකරුවකු වශයෙන් සමාගමේ භාරයේ පැවති ලේඛනයක්, භාණ්ඩ හෝ දේපළ ලෙස සලකනු ලැබිය යුතු අතර, එම ලේඛනය, භාණ්ඩ හෝ දේපළට අදාළව යම් භාරකාර ගිවිසුමක් යටතේ වූ ඩීඑෆ්සීසී බැංකුවේ අයිතිවාසිකම් සහ බැඳීම්, සමාගමේ අයිතිවාසිකම් සහ බැඳීම් ලෙස සලකනු ලැබිය යුතුය;

(ඒ) ඩීඑෆ්සීසී බැංකුව විසින් නිකුත් කරනු ලදුව නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් ස්ථානයක ස්කන්ධ හුවමාරුවක හෝ සුරැකුම්පත් හුවමාරුවක ලැයිස්තුගත කර ඇති කවර ආකාරයක හෝ කොටස් හෝ සුරැකුම්පත් නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි සමාගමේ කොටස් හෝ සුරැකුම්පත් ලැයිස්තුගත කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඔ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී යම් නීතියක විධිවිධානයක නැතහොත් යම් නියාමන අවශ්‍යතාවයක කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඩීඑෆ්සීසී බැංකුව විසින් පවත්වාගෙන යන ලද සියලු සංචිත, නිශ්චිත දින සිට බලපවත්වන පරිදි ඒ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන සමාගමේ සංචිත ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඕ) (i) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති ඩීඑෆ්සීසී බැංකුවේ (මුදල් ශේෂ, සංචිත අරමුදල්, ආයෝජන, වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, බලපත්‍ර සහ තැන්පතු ද ඇතුළුව) සියලු නිශ්චල හා චංචල දේපළ ද;

(ii) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති ඩීඑෆ්සීසී බැංකුවේ තැන්පතු හා අසම්භාව්‍ය බැරකම් ඇතුළුව සියලු බැරකම් ද;

(iii) මුදල් මණ්ඩලය විසින් බැංකු පනතේ 76(අ) වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංකුව වෙත නිකුත් කළ බලපත්‍රය ද ඇතුළුව, නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති, ව්‍යාපාරය තුළ හෝ ව්‍යාපාරයෙන් උද්ගත වන, නැතහොත්, ව්‍යාපාරයේ දේපළවලින් හා බැරකම්වලින් උද්ගතවන සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාර, බැඳීම්, යුතුකම් සහ ස්වාර්ථ සම්බන්ධතා ද;

(iv) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති, ඩීඑෆ්සීසී බැංකුවට හෝ එම බැංකුවේ යම් දේපළවලට අදාළ හෝ අනුබද්ධ සියලු පොත්පත්, ගිණුම් සහ ලේඛන ද,

නිශ්චිත දිනයේ සිට සමාගමේ දේපළ, බැරකම්, අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාර, බැඳීම්, යුතුකම්, ස්වාර්ථ සම්බන්ධතා, පොත්පත්, ගිණුම් සහ ලේඛන ලෙස සලකනු ලැබිය යුතු ය.

(ක) යම් නීතියක විධිවිධානයක් යටතේ ඩීඑෆ්සීසී බැංකුව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලදුව, නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පැවති කවර හෝ ස්වභාවයක වූ සියලු ඉල්ලීම්, නඩු, නඩු කටයුතු හෝ අභියාචනා, නිශ්චිත දිනයේ සිට සමාගම විසින් හෝ සමාගමට විරුද්ධව පවරනු ලැබූ ඉල්ලීම්, නඩු, නඩු කටයුතු හෝ අභියාචනා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා පවත්වාගෙන යා හැකි ය.

(ග) ඩීඑෆ්සීසී බැංකුවේ යම් සේවා නියුක්තයකුගේ හෝ එහි පෙර සිටි සේවා නියුක්තයකුගේ පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභයකට අදාළ යම් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් බැරකමක් හා සම්බන්ධ වූ ද නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ ද යම් විශ්‍රාම වැටුප් අරමුදලක්, පාරිතෝෂික අරමුදලක් හෝ අරමුදලක් රහිත බැරකමක්, නිශ්චිත දින සිට බලපවත්වන පරිදි ඒ සේවානියුක්තයා හෝ පෙර සිටි සේවා නියුක්තයා සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, සමාගමේ විශ්‍රාම වැටුප් අරමුදලක්, පාරිතෝෂික අරමුදලක් හෝ බැරකමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ච) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුව තම සේවා නියුක්තයන්ගේ ප්‍රතිලාභය වෙනුවෙන් කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලක දායකයකුව සිටින අවස්ථාවක දී, නිශ්චිත දින සිට බලපවත්වන පරිදි, සමාගම ඒ සේවා නියුක්තයන් සම්බන්ධයෙන් වූ ඒ අර්ථසාධක අරමුදලේ දායකයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(ජ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුවට අදාළව පැවති සියලු බදු බැර කිරීම්, ආපසු ගෙවීම්, පාඩු, අනුග්‍රහ, සහන, ප්‍රතිලාභ සහ බැරකම්, සමාගමේ බදු බැර කිරීම්, ආපසු ගෙවීම්, පාඩු, අනුග්‍රහ, සහන, ප්‍රතිලාභ සහ බැරකම් ලෙස නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි සලකනු ලැබිය යුතු ය;

(ට) කවර හෝ අධිකරණයක් විසින් යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී ඩීඑෆ්සීසී බැංකුවට පක්ෂව හෝ එරෙහිව සටහන් කරන කරන ලද සියලු නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා, සමාගමට පක්ෂව හෝ එරෙහිව සටහන් කරනු ලැබූ නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස, නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි සලකනු ලැබිය යුතු ය;

(ඩ) නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුවේ වාසියට පැවති, වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, මෘදුකාංග ඇතුළු බුද්ධිමය දේපළවලට අදාළ සියලු අයිතිවාසිකම්, නිශ්චිත දින සිට බලපවත්වන පරිදි සමාගමේ වාසියට පැවති එම අයිතිවාසිකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

6. (165 වන අධිකාරය වූ) ඩීඑෆ්සීසී බැංකුව පනත, මේ පනතේ 2 වන වගන්තිය මගින් ඉවත් කරනු ලැබුව ද, එය නොතකා ඉහත කී ඉවත් කරන ලද පනතේ 10 වන වගන්තියේ 2 වන උපවගන්තියේ සහ 14 වන වගන්තියේ විධිවිධාන, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඒ වගන්තිවලට අනුව ඇප වන ලද ණය මුදල් සම්පූර්ණයෙන් බේරුම් කරන තෙක් සහ ඒ දක්වා පමණක්, ඒ පනත කිසිවිටෙක ඉවත් නොකරන ලද සේ, නිශ්චිත දිනයේ සිට සහ ඉන් පසුව තවදුරටත් ක්‍රියාත්මක ව සහ නීතිය අනුව පූර්ණ බලපෑමෙන් සහ උපයෝජ්‍යතාවයෙන් යුක්ත විය යුතු යත ඊට වැඩිදුරටත් බල නොපෑ යුතු ය. ඉහත දැක්වුණු පරිදි නිශ්චිත දිනයට පෙරාතුව ඇප වන ලදුව නිශ්චිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ සෑම ණය මුදලක් ම, එසේ ඇප වූ එම ණය මුදල් සමාගම ලබා ගත් ණය මුදල් වූවාක් සේ නිශ්චිත දිනයේ සිට තවදුරටත් පැවතිය යුතු ය.

7. (1) නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි, යම් පනතක, නියෝගයක, නිවේදනයක, කොන්ත්‍රාත්තුවක, සාධන පත්‍රයක, වාර්තාවක, කොටස් සහතිකයක, ලේඛනයක, ඔප්පුවක, බැඳුම්කරයක, ගිවිසුමක, ඇපකරයක, ඇටෝර්නි බලපත්‍රයක, නෛතික නියෝජිතත්ව ප්‍රදානයක සහ කවර වූ හෝ ස්වභාවයක වූ වෙනත් සාධන පත්‍රයක ඩීඑෆ්සීසී බැංකුව පිළිබඳ ව ඇති සෑම සඳහනක් ම, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම පිළිබඳ සඳහනක් ලෙස සැලකිය යුතු ය.

(2) 5 වන වගන්තියේ සහ (1) වන උපවගන්තියේ විධිවිධාන බලාත්මක වීම සඳහා යම් නීතියක් හෝ නියෝගයක් යටතේ යම් දෙපාර්තමේන්තුවක්, අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ රජයේ නියෝජිත ආයතනයක්, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන යම් රෙජිස්ටරයක හෝ වාර්තාවක ඩීඑෆ්සීසී බැංකුව යන නාමය වෙනුවට සමාගමේ නාමය ආදේශ කිරීම අවශ්‍ය නොවන නමුත්, සමාගම විසින් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සත්‍ය පිටපතක් වශයෙන් සහතික කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපතක් සමඟ එම රෙජිස්ටරය හෝ වාර්තාව පවත්වාගෙන යාමේ වගකීම දරන තැනැත්තා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී ඒ තැනැත්තා විසින් එම රෙජිස්ටරයේ හෝ වාර්තාවේ සමාගමේ නාමය ආදේශ කරනු ලැබිය යුතු ය.

8. (1) ඩීඑෆ්සීසී බැංකුවේ ව්‍යාපාරය 4 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සමාගම වෙත සතු කර දීම පහසු කරවීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝග එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද සේ සැලකිය යුතු නමුත් ඒ නියෝගය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) එම නියෝගයේ අනනුමතයේ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

9. මේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවනු ලබන සමාගම, මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රය යටතේ බලපත්‍රලත් වාණිජ බැංකුවක් ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා 2007 අංක 07 දරන සාමාගම් පනතේ VIII වන කොටසේ

විධිවිධාන යටතේ වෙනත් සමාගමක් සමඟ බද්ධ කරනු ලබන හෝ ඒකාබද්ධ කරනු ලබන අවස්ථාවක දී මේ පනතේ 6 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව තවදුරටත් අදාළ විය යුතු ය.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

11. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ කාර්ය සඳහා—

"බැංකු පනත" යන්නෙන්, වරින් වර සංශෝධිත පරිදි වූ 1988 අංක 30 දරන බැංකු පනත අදහස් වේ;

"ව්‍යාපාරය" යන්නට නිශ්චිත දිනයේ දී ඩීඑෆ්සීසී බැංකුව විසින් බලපත්‍රලත් විශේෂිත බැංකුවක් වශයෙන් කරගෙන යන ලද ව්‍යාපාරය ඇතුළත් වේ;

"සමාගම" යන්නෙන්, 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සමාගම අදහස් වේ;

"විනිමය පාලක" යන්නෙන්, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත යටතේ මුදල් මණ්ඩලය විසින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අදහස් වේ;

"ඩීඑෆ්සීසී බැංකුව" යන්නෙන්, වරින් වර සංශෝධිත පරිදි වූ (165 වන අධිකාරය වූ) ඩීඑෆ්සීසී බැංකුව පනත මගින් පිහිටුවනු ලැබූ ඩීඑෆ්සීසී බැංකුව අදහස් වේ;

"බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ;

"ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අදහස් වේ;

"නාගරික සංවර්ධන අධිකාරිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ.